# රාජකීය විදුහල කොළඹ 07
## Royal College – Colombo 07

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
**Grade 13 – Final Term Test June 2010**

කාලය පැය 01

# ව්‍යාපාර අධ්‍යයනය I – I කොටස

**උපදෙස් :**
*** පළමු ප්‍රශ්න පත්‍රයේ අංක 01 සිට අංක 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**
*** 21 30 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**
*** 31 40 දක්වා ප්‍රශ්න වලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

(01) සමෝධානික ව්‍යාපාර ව්‍යුහයක් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. ඒ ඒ කොටස් සෙසු කොටස් මත යැපීමක් සිදු නොවේ.
ii. එක් එක් කොටස් වෙනම විශ්ලේෂණය කර තිරණ ගත හැකිය.
iii. ව්‍යාපාරයේ එක් එක් අංශ පිළිබඳ වෙන වෙනම තීරණ ගත යුතුය.
iv. ව්‍යාපාරයේ පිළිබඳ සමස්ථ අවබෝධය වැදගත් වේ.
v. ව්‍යාපාරයේ මූලිකාංග වෙන් වෙන්ව ක්‍රියාත්මක වේ.

(02) ශ්‍රී ලංකාවේ සේවා අංශයේ වර්ධනයම බලපා ඇති හේතුවකි.

i. නාගරීකරණය
ii. ජනගහනය ඉහළ යාම
iii. සාක්ෂරතාවය ඉහළ යාම
iv. ජීවන රටාව වෙනස් වීම.
v. කෘෂි කාර්මික අංශයේ වර්ධනය

(03) පාරිභෝගිකයා තුළ යම් භාණ්ඩයක් පිළිබඳ විශේෂ ආකල්පයක් ගොඩනැගී ඇත්නම් එම භාණ්ඩය,

i. සාමාන්‍ය භාණ්ඩයකි.
ii. විශේෂිත භාණ්ඩයකි
iii. සාප්පු භාණ්ඩයකි
iv. නොසෙවූ භාණ්ඩයකි
v. පාරිභෝගික භාණ්ඩයකි

(04) අයිතිකරුවන්ගේ විශ්වාස හා අසමානකම් මත එහි අයිතිකරුවන් විසින් ස්ථාපිත කරනු ලබන්නේ,

i. දැක්ම   ii. මෙහෙවර   iii. අරමුණු

iv. පරමාර්ථ   v. ව්‍යාපාර සැලැස්ම

(05) පැරණි ආර්ථිකය තුළ පැවැති ව්‍යාපාර පරිචයකි.

i. සියලුම දෙනා අලෙවිකරන ඉටුකිරීම

ii. අඩු පොරොන්දු වැඩි ඉටුකිරීම

iii. ගනුදෙනුකරු මුල්කරගෙන ව්‍යාපාර කටයුතු සංවිධානය කිරීම

iv. ක්‍රියාකාරකම් හරහා සංගම් වරණය ගොඩනැගීම

v. කොටස් හිමියන් ගැන සැලකිලිමත් වීම

(06) ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අවධානයට ලක්ව ඇත්තේ,

i. අමුද්‍රව්‍ය ආනයනය කර කර්මාන්ත ආරම්භ කිරීම.

ii. මහා පරිමාණ කර්මාන්ත වැඩි වැඩියෙන් ආරම්භ කිරීම.

iii. විදේශ තාක්ෂණය සංවර්ධන රටවලින් ලබාගෙන කර්මාන්ත ආරම්භ කිරීම

iv. පෞද්ගලික අංශය කර්මාන්ත අංශයේ ආයෝජනය සඳහා දිරිමත් කිරීම

v. ආනයන ආදේශන කර්මාන්ත ආරම්භ කිරීම.

(07) ව්‍යාපාර පරිසරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය ලෙස කොටස් දෙකක බෙදේ.

ii. අභ්‍යන්තර සහ සාර්ව පරිසරය ලෙස කොටස් දෙකට බෙදේ.

iii. අභ්‍යන්තර පරිසරයට ගනුදෙනුකරුවන් අයත් වේ.

iv. ආසන්න පරිසරයට කලමනාකරුවන් අයත් වේ.

v. ආසන්න පරිසරයට සේවකයන් අයත් වේ.

(08) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය ශක්තීන්ගෙන් යුක්ත වන්නේ නම් ද බාහිර පරිසරය තර්ජනාත්මක වත්කම් ද ව්‍යාපාර ගතයුතු පියවර වන්නේ,

i. හොඳ අවස්ථාවකි ඉන් ප්‍රයෝජන ගත යුතුය.

ii. දුර්වලතා සහ තර්ජන ඉවත්ව යනතුරු රැඳී සිටිය යුතුය.

iii. දුර්වලතා මගහරවා ගෙන ශක්තිමත් විය යුතුය.

iv. තර්ජන පිළිබඳ සැලකිලිමත් වී උපක්‍රමශීලිව ශක්තීන් මගින් තර්ජන පරාජය කළ යුතුය.

v. ව්‍යාපාර කටයුතු වලින් ඉවත් විය යුතුය.

(09) ව්‍යාපාර සමාජ වගකීමේදී ප්‍රමුඛතාවය දිය යුතු අංශයකි.

i. පාරිභෝගිකයා ii. ආයෝජකයා iii. භාණ්ඩය

iv. මානව අයිතීන් v. ව්‍යාපාරය

(10) බුද්ධිමය දේපලට අදාල ආචාර ධර්මයකි.

i. සේවක දක්ෂතා යටපත් නොකිරීම

ii. ගුණාත්මක භාණ්ඩ ඉදිරිපත් කිරීම

iii. තරගකාරි ලෙස ව්‍යාපාරවල නිරත නොවීම

iv. ව්‍යාපාර පිරිවැය අවම කර ගැනීම

v. සේවක සුභ සාධනය ඉහල නැංවීම

(11) මූල්‍ය උපකරණ හා මුදල් සැපයුම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. සංචිත අවශ්‍යතා පහත හෙලීම මුදල් සැපයුම වැඩිවේ.

ii. වට්ටම් අනුපාතය ඉහළ දැමීම මුදල් සැපයුම වැඩිවේ.

iii. සුරකුම්පත් මිලදී ගැනීම මුදල් සැපයුම අඩුවේ.

iv. ණය පාලනය ලිහිල් කිරීම මුදල සැපයුම අඩුවේ.

v. සංචිත අවශ්‍යතා ඉහල දැමීම මුදල් සැපයුම වැඩිවේ.

(12) තොරතුරු ආරක්ෂණ කළමනාකරන පද්ධතිය සම්බන්ධ ප්‍රමිතිය වන්නේ,

i. ISO 17000 ii. ISO 21000 iii. ISO 27000

iv. ISO 14000 v. ISO 18000

(13) පේටන්ට් බලපත්‍රයක් වලංගු වන්නේ උපරිම වශයෙන්,

i. අවුරුදු 20 යි ii. අවුරුදු 10 යි iii. අවුරුදු 05 යි

iv. අවුරුදු 15 යි v. අවුරුදු 25 යි

(14) සංස්ථාපිත සමාගමක සංවිධාන ව්‍යුහය තුළ ඉහලින්ම සිටින්නේ,

i. මධ්‍ය කළමනාකරුවන්

ii. කොටස් හිමියන්

iii. අග්‍ර කළමනාකරුවන්

iv. ප්‍රධාන විධායක නිලධාරි

v. අධ්‍යක්ෂක මණ්ඩලය

(15) මහජනයා සතු ඉතිරි කිරීමේ තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා වානිජ පත්‍රිකා අයත් වනුයේ,

i. වලංගු මුදල් වලටය

ii. බැංකු මුදල් වලටය

iii. ආසන්න මුදල් වලටය

iv. ද්‍රව්‍ය මුදල් වලටය

v. ප්‍රමාණික මුදල් වලටය

(16) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වගකීමකි.

i. රක්ෂණ ඔප්පු ලබාදීම.

ii. රක්ෂිකයන් රක්ෂණයක් අතර සම්බන්ධතාවයක් ගොඩනැගිම

iii. රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

iv. රක්ෂණ ප්‍රවර්ධන කටයුතු වල නිරත වීම

v. රක්ෂණ අරමුදල් ආයෝජනය කිරීම.

(17) ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කළමනාකාරිත්වය දරනුයේ,

i. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවටය

ii. ශ්‍රී ලංකා මහ බැංකුවටය

iii. මහජන බැංකුවටය

iv. රජයටය

v. ලංකා බැංකුවටය

(18) ආනයන සටහන්කරය ඉදිරිපත් කළ යුත්තේ,

i. අපනයනකරු

ii. ආනයනකරු

iii. රක්ෂණ සමාගම

iv. වානිජ බැංකුව

v. නැව් සමාගම

(19) දැනුම් මට්ටමේ තොරතුරු පද්ධතිය

i. MIS    ii. DSS    iii. TPS

iv. OAS    v. ESS

(20) විද්‍යුත් ව්‍යාපාර ආකෘතියකි

i. E – mail    ii. E - Government    iii. Google

iv. E - shop    v. E - money

(21) ව්‍යාපාර ආයතනය සතු ........................................ එකතුව දැනුම ලෙස හැඳින්වේ.

(22) බැංකු ගිණුමකින් මුදල් ඉවත් කර ගැනීමේදී ........................................ බදු අය කෙරේ.

(23) 2007 අංක 07 දරණ සමාගම් පනතකින් ........................................ සමාගම් හඳුන්වා දී ඇත.

(24) සමාගම් සම්බන්ධයෙන් අදාල අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා ........................................ සභාව පිහිටුවා ඇත.

(25) ශ්‍රී ලංකාව සම්බන්ධ වෙබ් අඩවි ........................................ වලින් අවසන් වේ.

(26) ව්‍යාපාර වල සත්‍ය සාර්ථකත්වයට බලපාන ප්‍රධාන සාධකය ........................................ පාර්ශව වලට ප්‍රතිලාභ ලබාදීම වේ.

(27) රජයේ ප්‍රමිති ආයතනය මගින් සහතික කරන ලද වෙළඳ ලකුණු ........................................ කරන ලද වෙළඳ ලකුණු ලෙස හැඳින්වේ.

(28) සීමිත සමාගමේ ව්‍යවස්ථාවලිය ලෙස පනතේ සඳහන් ........................................ ව්‍යවස්ථාවලිය සමාගමකට භාවිතා කළ හැකිය.

(29) සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ........................................ අංශයේ ආයතනයකි.

(30) චෙක්පතක් අගරුවූ විට එය දැනුම් දීමට ........................................ නිවේදන ලියවිල්ල භාවිතා කෙරේ.

(31) කළමනාකරුවන්ගේ ප්‍රධාන කාර්යයන් මොනවාද?

i. ...........................................................................................................

ii. ...........................................................................................................

iii. ...........................................................................................................

iv. ...........................................................................................................

(32) වටිනාකම සාධක තුනක සංකලනයකි.

i. ...........................................................................................................

ii. ...........................................................................................................

iii. ...........................................................................................................

(33) ප්‍රධාන වක්‍රබදු වර්ග තුන වන්නේ,

i. ...........................................................................................................

ii. ...........................................................................................................

iii. ...........................................................................................................

(34) පරිමාණය අනුව කර්මාන්ත වර්ග කර දක්වන්න.

i. ..........................................................................................................

ii. ..........................................................................................................

iii. ..........................................................................................................

iv. ..........................................................................................................

(35) ආර්ථික පරිසරයට අයත් උප සාධක හතරක් සඳහන් කරන්න.

i. ..........................................................................................................

ii. ..........................................................................................................

iii. ..........................................................................................................

iv. ..........................................................................................................

(36) බුද්ධිමය දේපල වලට අයත් වන්නේ,

i. ..........................................................................................................

ii. ..........................................................................................................

iii. ..........................................................................................................

(37) නැව් භාණ්ඩ රක්ෂණයේදී භාවිතා කරන රක්ෂණ ඔප්පු වන්නේ,

i. ..........................................................................................................

ii. ..........................................................................................................

iii. ..........................................................................................................

(38) භාණ්ඩ තොග වෙළඳුන් ඔවුන් සපයන සේවා අනුව ප්‍රධාන කොටස් දෙකකි. ඒ මොනවාද?

i. ..........................................................................................................

ii. ..........................................................................................................

iii. ..........................................................................................................

(39) වෙළඳ ගිණුමට අයත් කොටස් දෙක වන්නේ,

i. ..........................................................................................................

ii. ..........................................................................................................

(40) ගෝලීය වෙළඳමේ ව්‍යාප්තියට ඇති බාධා දෙක වන්නේ,

i. ..........................................................................................................

ii. ..........................................................................................................

# රාජකීය විදුහල කොළඹ 07
## Royal College – Colombo 07

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
**Grade 13 – Final Term Test June 2010**

කාලය පැය 02

## ව්‍යාපාර අධ්‍යයනය I – II කොටස

**උපදෙස් :**
*** පළමු ප්‍රශ්නයට හා දෙවැනි ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**
*** සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සැපයීමේදී අලුත් පිටුවකින් ආරම්භ කරන්න.**

(01)

i ගණුදෙනුකරුවන්ට සහ සමාජයට ව්‍යාපාර වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. ව්‍යාපාරිකයකු නිෂ්පාදනය කරන භාණ්ඩයක හෝ සේවාවක වටිනාකම වැඩි කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද? (ලකුණු 03)

iii. නිෂ්පාදන දමය යනු කුමක්දැයි උදහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. හවුල් ව්‍යාපාර වල හවුල්කරුවන්ගේ වගකීම්, ප්‍රාග්ධනය යෙදවීම, කළමණාකරණයට සහභාගි වීම හා ජනතාව දැනුවත් හා නොදැනුවත් භාවය අනුව විග්‍රහ කරන්න. (ලකුණු 03)

v. ව්‍යාපාරයේ පරමාර්ථ ලඟාකර ගැනීමේදී ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයේ ඇති ශක්තින් හා දුර්වලතා මෙන්ම බාහිර පරිසරයේ ඇති අවස්ථා හා තර්ජන බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

vi. සීමාසහිත පොදු සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය තුළ අන්තර්ගත කරුණු කවරේද? (ලකුණු 03)

(02) i. (අ) ලේඛණ පදනම් කරගත් ගෙවීම් පියවීම් උපකරණ හා විද්‍යුත් ගෙවීම් උපකරණ සඳහන් කරන්න.
(ආ) චෙක්පත් මගින් ගෙවීම් පියවීමෙන් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි කවරේද? (ලකුණු 03)

ii. (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සඳහන් කරන්න.
(ආ) නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමයේ වාසි සඳහන් කරන්න. (ලකුණු 03)

iii. රක්ෂණ මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. දුම්රිය ප්‍රවාහනය දියුණු කිරීමට රජය මෑතදී ගෙන ඇති ක්‍රියා මාර්ග සඳහන් කරන්න. (ලකුණු 03)

v. කෙටි සටහන් ලියන්න.
(අ) ගැසට් පත්‍රය
(ආ) ඉන්ඩෙන්ටුව
(ඇ) ගුදම් බලපත්‍රය (ලකුණු 03)

vi. ව්‍යාපාර සංවිධානයක අභ්‍යන්තරයේ ඇති සන්නිවේදනය ගලා යන දිසාව අනුව වර්ග කර එය රූප සටහනකින් පෙන්නුම් කරන්න. (ලකුණු 03)

(03) i. (අ) මෙහෙවර ප්‍රකාශය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
(ආ) මෙහෙවර ප්‍රකාශයක අන්තර්ගත කරුණු මොනවාද? (ලකුණු 03)

ii. ව්‍යාපාර වලට බලපාන රජයේ නීතිරීති ප්‍රධාන කොටස් තුනකි. ඒවා උදහරණ සහිතව සඳහන් කරන්න. (ලකුණු 03)

iii. පාරිභෝගික අයිතිවාසිකම් තහවුරු කර ගැනීම සඳහා පාරිභෝගික අප ඉටුකළ යුතු යුතුකම් කවරේද? (ලකුණු 03)

iv. සමාගමක් සතු නීතිමය අයිතීන් හා බැඳීම් සඳහන් කරන්න. (ලකුණු 03)

(04) i. පොදු සමාගමක සංවිධාන ව්‍යුහය රූප සටහනකින් දක්වන්න. (ලකුණු 03)

ii. සංස්ථාගත කිරීමේ සහතිකයෙහි නිශ්චිතව අන්තර්ගත වන කරුණු සඳහන් කරන්න.(ලකුණු 03)

iii. සමූපකාර ව්‍යාපාර ක්‍රමයම පදනම් වී ඇති අසමානකම් මොනවාද? (ලකුණු 03)

iv. වෙළඳම විධිමත් කිරීම සඳහා පාරිභෝගික අධිකාරියට ඇති බලතල කවරේද? (ලකුණු 03)

(05) i. (අ) ගනුදෙනු කළ හැකි ලියවිල්ලක් යනු කුමක්ද?
(ආ) ගනුදෙනු හැකි ලියවිල්ලක තිබිය යුතු ගති ලක්‍ෂණ කවරේද? (ලකුණු 03)

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරන ව්‍යුහය සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ව්‍යාපාර බැංකුවකින් ලබාගත හැකි සේවා සඳහන් කරන්න. (ලකුණු 03)

iv. ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ඉටුකරන කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 03)

(06)

i. ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ඔබේ මිතුරකු ජංගම ගිණුමක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඔහු චෙක් පතක් ලිවීම සම්බන්ධයෙන් ඔබගෙන් උපදෙස් පතන්නේ නම් ඔබ ලබාදෙන උපදෙස් මොනවාද? (ලකුණු 03)

ii. සඵලදායි සන්නිවේදනය කවර සාධක මත රඳා පවතීද? (ලකුණු 03)

iii. නියෝජිතයන් වර්ගකර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. විද්‍යුත් වානිජ්‍යයෙන් ව්‍යාපාරිකයාට ලැබෙන වාසි හා පාරිභෝගිකයාට ලැබෙන වාසි සඳහන් කරන්න. (ලකුණු 03)

## රාජකීය විදුහල කොළඹ 07
## Royal College – Colombo 07

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
**Grade 13 – Final Term Test June 2010**

කාලය පැය 01

# ව්‍යාපාර අධ්‍යයනය II – I කොටස

**උපදෙස් :**
*** ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
*** අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදි වඩාත් නිවැරදි පිළිතුරට දී ඇති කොටුවේ √ යොදන්න.**

---

1) එකතුකල අගය මත අයකරන බද්ධ (Vat)

☐ 1. ආදයම් මත පනවන බද්දකි.

☐ 2. ප්‍රාග්ධන ලාභ මත පනවන බද්දකි.

☐ 3. ලාභය මත පනවන බද්දකි.

☐ 4. වක්‍ර බද්දකි.

☐ 5. අනුක්‍රමික බද්දකි.

2) අලෙවිකරණයේදී නිෂ්පාදිත මිශ්‍රයට අයත් නොවන්නේ,

☐ 1. ගුණාත්වය

☐ 2. වගකීම

☐ 3. ආවරණය

☐ 4. නිර්මානය

☐ 5. ප්‍රමානය

3) පාරිභෝගික තෘප්තිය අලෙවිකරණයේදි වැදගත් සාධකයකි. පාරිභෝගිකයා තෘප්තිමත් වි සිටි ද යන්න හඳුනාගැනිම සඳහා යොද ගන්නා නිර්නායකයකි.

☐ 1. ආකර්ශනිය ඇසුරුමක් භාවිතා කිරීම.

☐ 2. පුළුල් ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

☐ 3. පෞද්ගලික අලෙවි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

☐ 4. නිම්භාණ්ඩ පරික්ෂාවෙන් පසු වෙළඳපොලට ඉදිරිපත් කිරීම.

☐ 5. රහස්‍ය සාප්පු සාවාරි ක්‍රම භාවිතා කිරීම.

4) ශ්‍රී ලංකාවේ කුඩාපරිමාන ව්‍යාපාර සංවර්ධනය සඳහා රජයේ සහ රාජ්‍ය අනුබද්ධිත ආයතන මගින් විවිධ සේවා සපයයි. ඒ අනුව උපදේශක, අලෙවි, යටිතල පහසුකම් ලබාදෙන රාජ්‍ය ආයතන වන්නේ

- ☐ 1. ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය
- ☐ 2. ජාතික සංවර්ධන බැංකුව
- ☐ 3. ආයෝජන මණ්ඩලය
- ☐ 4. කාර්මික සංවර්ධන මණ්ඩලය
- ☐ 5. කර්මාන්ත සංවර්ධන දෙපාර්මේන්තුව

5) "ගැමිර" සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායක ණය යෝජනා ක්‍රමයට අරමුදලක සපයන ආයතනය වන්නේ

- ☐ 1. ලංකා බැංකුව
- ☐ 2. ප්‍රාදේශිය සංවර්ධන බැංකුව
- ☐ 3. ජාතික සංවර්ධන බැංකුව
- ☐ 4. හැටන් නැෂනල් බැංකුව
- ☐ 5. ශ්‍රී ලංකා මහා බැංකුව

6) අරමුණු හා පරමාර්ථය මුදුන් පමුණුවා ගැනිම සඳහා සම්පත් නිසි ලෙස යොදගැනිම පිලිබඳ ගම්‍ය වන සංකල්පය වන්නේ

- ☐ 1. සඵලදයිතාව
- ☐ 2. ඵලදයිතාව
- ☐ 3. කාර්යක්‍ෂතාවය
- ☐ 4. අභිප්‍රේරණය
- ☐ 5. ව්‍යාපාර ප්‍රතිත්ති

7) නිෂ්පාදන කළමනාකරණයට අයත් කාර්යයක් නොවන්නේ

- ☐ 1. ද්‍රව්‍ය මිලදී ගැනිම
- ☐ 2. පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- ☐ 3. ඉංජිනේරුකරණය
- ☐ 4. නිෂ්පාදන සැලසුම්කරණය
- ☐ 5. ආයතනයේ කිර්තිනාමය වර්ධනය කර ගැනිම

8) ව්‍යවසායකත්වය සංවර්ධනය බලනොපාන පුද්ගල සාධකයකි.

- [ ] 1. පලපුරුද්ද
- [ ] 2. කුෂිතකම
- [ ] 3. උපායමාර්ග
- [ ] 4. කළමනාකරණය
- [ ] 5. ආදර්ශ චරිත

9) නවක සේවකයන් ආයතනයට බඳවා ගත් පසු එම ආයතනය විවිධ දෑ පිලිබඳව දැනුවත් කරමින් ආයතනයට හුරු කිරිම හඳුන්වන්නේ

- [ ] 1. පුහුණුව ලබාදිම
- [ ] 2. සංවර්ධනය කිරීම
- [ ] 3. අනුස්ථාපනය කිරීම
- [ ] 4. කාර්‍යඵල ඇගයීම
- [ ] 5. රුකියා මිලනය

10) රැකියා විස්තරයේ අඩංගු තොරතුරකි.

- [ ] 1. කාර්යභාරය හා වගකීම
- [ ] 2. රැකියාවේ සවභාවය
- [ ] 3. රැකියා ස්ථානය
- [ ] 4. සේවා කොන්දේසි
- [ ] 5. අධ්‍යාපන, පලපුරුද්ද, වෘත්තිය සුදුසුකම්

11) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත තොරතුරු අතර උපක්‍රම හා ක්‍රියාත්මක කිරීමේ සාරංශයෙහි ඇතුලත් වන්නේ

- [ ] 1. ව්‍යාපාර ආයතනයේ නම පිලිබඳ තොරතුරුය.
- [ ] 2. සංවිධාන ව්‍යුහය පිලිබඳ තොරතුරුය.
- [ ] 3. විකුණුම් පිලිබඳ තොරතුරුය.
- [ ] 4. මිල කිරිමේ උපාය මාර්ග පිලිබඳ තොරතුරුය.
- [ ] 5. බෙදාහැරිම අතර මැදියන් පිලිබඳ තොරතුරුය.

12) භාවිතාකරන විදුලිබල ධාරිතාව පදනම්කරගෙන කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමේ නිර්නායකය ඉදිරිපත් කර ඇත්තේ

- ☐ 1. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගිනි.
- ☐ 2. ආයෝජන මණ්ඩලය මගිනි.
- ☐ 3. ශ්‍රී ලංකා මහා බැංකුව මගිනි.
- ☐ 4. අපනයන සංවර්ධන මණ්ඩලය මගිනි.
- ☐ 5. කාර්මික තාක්ෂණ ආයතනහ මගිනි.

13) ව්‍යාපාරිකයන් විසින් භාණ්ඩවල මිල නියම කිරීමේදි අනුගමනය කරනු ලබන ප්‍රධාන මිල ප්‍රතිපත්තියක් වන්නේ

- ☐ 1. වෙළඳපොල සාරය උරාගැනීමේ මිල
- ☐ 2. වෙළඳපොල අල්ලා ගැනීමේ මිල
- ☐ 3. පවතින මිල වෙනස් කිරීමේ මිල
- ☐ 4. භාණ්ඩ මිශ්‍ර මිල
- ☐ 5. පිරිවැයට නැඹුරු වූ මිල

14) කොළඹ කොටස්වෙළඳපොළේ ලැයිස්තුගත කොට ඇති විශාලතම හා වඩාත් ද්‍රවශීලතාවයක් ඇති සමාගම් 25 ක මිල ගනන්වල සමාන්‍ය හැසිරීම් නිරූපනය කරන මිල දර්ශකය හඳුන්වන්නේ

- ☐ 1. මුළු ප්‍රතිලාභ දර්ශකය
- ☐ 2. සියළු කොටස් මිල දර්ශකය
- ☐ 3. මිලංකා මිල දර්ශකය
- ☐ 4. ක්ෂේත්‍ර මිල දර්ශකය
- ☐ 5. මුර්ථ සඵල විනිමය දර්ශකය

15) එක්තරා භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයක ස්ථාවර පිරිවැය රු. 50,000 කි. එක් භාන්ඩයක විචල්‍ය පිරිවැය රු.25/= කි. අපේක්ෂිත විකුණුම් ප්‍රමාණය 10000 කි. මෙම ආයතනය 25% ලාභයක් ලැබෙන සේ මිල නියම කරයි නම් ලකුණු කල යුතු මිල කවරේ ද?

1. රු. 30.00
2. රු. 25.00
3. රු. 37.50
4. රු. 32.50
5. රු. 27.50

16) සේව්‍යන් හා සේවකයන් අතර සිදුවන කාර්මික ආරවුලක් වියදම සඳහා මැදිහත් නොවන පාර්ශවයකි.

1. සේවක වෘත්තිය සමිති
2. ගනුදෙනුකරුවන්
3. රජයේ නියෝජිතයන්
4. සේවා යෝජකයන්
5. සේවා දයකයන්

17) මානව සම්පත් කළමණාකරණය ශ්‍රීතයට අයත් නොවන කාර්‍යයකි.

1. රැකියා විශ්ලේශනය කිරීම
2. කාර්යඵල ඇගයීම
3. මිනිස්බල සැලසුම්කරණය
4. රැකියා නිර්මානය කිරීම
5. නිෂ්පාදනය සඳහා ඉල්ලුමක් ඇති කිරීම

18) වර්තමානයේ කර්මාන්ත ශාලාවක් ස්ථානගත කිරීමේදි ඉතා වැදගත් කොට සැලකිය යුතු සාධකයකි.

1. යටිතල පහසුකම් ලබාගැනිමේ පහසුකම්
2. වෙළඳපොළ පහසුකම්
3. ශ්‍රමය ලබාගැනිමේ පහසුව
4. පරිසර නිතිරිති හා රෙගුලාසි සැළකිම
5. ප්‍රාග්ධනයට සපයා ගැනිමේ පහසුව

19) ආයතනවල තොග මට්ටම් පාලනය සඳහා භාවිතා නොකරන්නේ

1. ABC විශ්ලේශනය

2. JIT ක්‍රමය

3. ආර්ථික ඇනවුම් ප්‍රමාණය

4. පෙර ඇතුළු පෙර පිට ක්‍රමය

5. ද්විත්වභාජන ක්‍රමය)

20) තම හුරුපුරුදු සැයුම්කරුවන්ගෙන් භාන්ඩ ණයට ගැනිම කුමණ මූල්‍ය සම්පාදන මාර්ගයට අයත් වේද?

☐ 1. සාධ්‍යකරණය.

☐ 2. කල්බදු ක්‍රමය.

☐ 3. බැංකු අයිරා පහසුකම් ලබාගැනිම.

☐ 4. වෙළඳණය ලබාගැනිම.

☐ 5. විනිමය බිල්පත් වට්ටම් කර ගැනිම.

- **අංක 21 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

21) ව්‍යාපාරයක ලැබිය යුතු ණය විකුණන මුදල් ලබා ගැනිම ............................................ ලෙස හැඳින්වේ.

22) සේවාදයන පාර්ශවය වෙනුවෙන් සේවායෝජක පාර්ශව පමණක් දයක වන අරමුදල

.................................................................. යෙදු හැඳින්වේ.

23) නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය සම්පත් අවශ්‍ය වේලාවේදි, නිෂ්පාදනය එකතු කිරිම

.................................................................. වේ.

24) ජාතික සංවර්ධන භාරකාර අරමුදල් හා සමාජිකයන්ගේ තැන්පතු ප්‍රයෝජනයට ගෙන කුඩා ව්‍යාපාර සඳහා සර්වෝදය බැංකු හරහා ණය සපයන ව්‍යාපෘතිය ...................................... නමින් හැඳින් වේ.

25) කිසියම් රැකියාවන් වඩා නිවැරදිව කිරිමටත් සේවකයන් තුල ආත්ම විශ්වාසය ගොඩනැගීමටත් ඉවහල් වන ආකාරයට සේවකයාට .................................................................. ලබා දිමත් සේවකයාගේ තත්වයට වඩා අනාගත ක්‍රියාකාරිත්වය ගැන සැලකිල්ල දක්වමින් සේවකයාට ලබා දෙන . .................................................................. මානව සම්පත් කලමණාකරණයේ වැදගත් කාර්යයකි.

26) විධිමත් හා සාධාරණ සුරකුම්පත් වෙළඳපොලක් ශ්‍රී ලංකාව තුල අභිකිරීම මූලික අරමුණ ලෙස කරගෙන ස්ථාපිත කළ රාජ්‍ය ආයතනය වන්නේ .................................................................. ය.

27) විකුණුම් උත්පාදනය කිරිමත්, ලාභ ඉපයිමත් සඳහා ඉවහල් කරගෙන සංවිධානයක සතු වගකිම් කොතරම් කාර්යක්ෂම ලෙස යොදගෙන තිබේස යන්න සොයා බලන අනුපාතය වන්නේ .................................................................. ය.

28) කිසියම් ආයතනයක් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ පෙළ සඳහාම එක් සන්නම් නාමයක් භාවිතා කරයි. නම් එය .................................................................. සන්න ලෙස හැඳින් වේ.

29) සම්ච්ජේද ලක්ෂ විග්‍රහය මූල්‍ය ප්‍රවාහ මූලයදර්ශක, මූල්‍ය ප්‍රකාශ, පුරෝකථනය කිරිම වැනි වැදගත් කරනු ව්‍යාපාර සැලැස්මේ . අන්තර්ගතය .................................................................. හි.

30) ශ්‍රී ලංකා රේගු දෙපාර්මේන්තුව .................................................................. අමාත්‍යංශය යටතේ ඇති රාජ්‍ය ආයතනයකි.

- **අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

31) ව්‍යාපාරයක ශේෂ පත්‍රයෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| සා.කො ප්‍රාග්ධනය | රු. මිලියන 40 |
| 8% වරණිය කොටස් ප්‍රාග්ධනය | රු. මිලියන 18 |
| 15% ණයකර | රු. මිලියන 05 |
| ලා/ලා/ ශේෂය | රු. මිලියන 20 |

මෙම ව්‍යාපාරයේ පවතින්නේ කුමන ප්‍රාග්ධන තෝලන තත්වයක් ද?

..................................................................................................................................

32) ණයකර රජයේ භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කරයන් වල අර්ථලාභි අයිතිය හුවමාරුව සඳහා කොටස්වෙළඳ පොලේ ක්‍රියාත්මක නව වෙළඳම් පද්ධතිය .................................................................. ලෙස හැඳින් වේ.

33) සංවර්ධන මූල්‍ය සමායතනය හා අනිකුත් වානිජ බැංකු ඒකාබද්ධ වි කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය සැපයිම සඳහා ආරම්භ කරන ලද .................................................................. ණය යෝජනා ක්‍රමයට .................................................................. බැංකුව මූල්‍ය පහසුකම් සපයා ඇත.

34) සේවකයන්ලේ අයිතිවාසිකම් /යුතුකම්/ පිලිපැදිය යුතු නෛතික වලංගුතාවයන් පිලිබඳව ඔවුන් වෙත ලබාදෙන මූලාශ්‍රය .................................................................. වේ.

35) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය ඒකාබද්ධ ප්‍රාග්ධනය සපයා ඇති රාජ්‍ය අනුබද්ද ආයතනය .................................................................. වේ.

36) අතර මැදියන්, ස්ථාන, තොග ගුනත්වය, ප්‍රවාහනය වැනි උපාංග අලෙවිකරන මිශ්‍රයේ

.................................................................. මූලිකාංගයට අයත් වේ.

37) භාණ්ඩයක් හෝ සේවකයන් පිලිබඳ ඉලක්ක වෙළඳපොලේ පාරිභෝගිකයන් දැනුවත් කිරීමත් එම භාණ්ඩ මිලයට ගැනිම සඳහා පෙළඹ විමත් සඳහා යොද ගනු ලබන උපාය මාර්ග සමූහය .................................................................. යනුවෙන් අදහස් කරයි.

38) සිමිත කපුගෙදර සමාගමේ පොත්වලින් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ගෙ/යුතු වැටුප් හා වේතන | 50,000 |
| ගෙ/සේ.අ. (සේවාදයකය) | 4,800 |
| ගෙ/උපයන විට බදු ගෙවීම | 5,200 |

සමාගම සේවකයන් වෙනුවෙන් 12% ක සේවක අර්ථසාදක, අරමුදල් දයකයක් හා සේ. නි. භාරඅමුදලට 3% ක. දයක මුදලක් දයක කරයි නම් සමාගමේ ආයතන පරිපාලන වියදම් වලට අන්තර්ගත කල යුතු අගය . ............................................................... කි.

39) යම් පුද්ගලයකුගේ නිෂ්පාදන කාර්යයන් කාර්යක්ෂම කිරීම සඳහා සිදු කරනු ලබන නිෂ්පාදන කලමනාකරණ කාර්‍යයක් ලෙස ................................ හැඳින් වේ.

40) සංවිධායනයක දැක්ම, මෙහෙවර, පරමාර්ථ මෙන්ම පැවැත්ම බලපාන තීර්ණ ගැනීම, දිගුකාලීන සැලසුම් සකස් කිරීම, හා ආයතනයේ අනිකුත් කළමනාකරණ මට්ටම් අතර සම්බන්ධතාව ගොඩනැගීමත් යන කාර්යයන් ඇතුලත් වන්නේ . ............................................................... ටය.

රාජකීය විදුහල  කොළඹ 07
**Royal College – Colombo 07**

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
**Grade 13 – Final Term Test  June 2010**

කාලය  පැය 02

# ව්‍යාපාර අධ්‍යයනය  II – II කොටස

**අයදුම්කරුවන්ට උපදෙස් :**
*** පලමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිලිතුරු සපයන්න.**
*** අලුතින් ආරම්භ කරන ප්‍රශ්නයට පිලිතුරු සැපයීමේදි අලුත් පිටුවකින් ආරම්භ කරන්න.**

---

1) i. අ. ව්‍යවසායකත්ව ක්‍රියාවලියට බලපෑම් කරන මූලික සාධක කවරේ ද?

ආ. එම සාධක වලට අයත් උපසාධක තුන බැගින් සඳහන් කරන්න.

ii. අ. බොහෝ ව්‍යාපාරිකයින් ද තමන්ගේ ව්‍යාපාරය කුඩා ව්‍යාපාර ලෙස හඳුන්වා දිමට උත්සහා ගනි. මෙයට හේතු කවරේ ද?

ආ. " කුඩා ව්‍යාපාරිකයින් නිරතුරුවම ගැටලු වලට මුහුණ දෙයි". ගැටලුවලට මුහුණ දෙන කුඩා ව්‍යාපාර සාර්ථක ව්‍යාපාර බවට පත්කර ගතහැකි ක්‍රියාමාර්ග ලෙස, ඔබ කරන යෝජනා කවරේ ද ?

iii. " අලෙවිකරණයේදි වෙළෙඳපොල බන්ධනය ව්‍යාපාරිකයන්ට සාර්ථක අලෙවිකරණ ක්‍රියාදමයකට ඇත් වැලකි." ඒ අනුව වෙළෙඳපොළ බන්ධනය යනුවෙන් කුමක් අදහස් වන්නේ ද? උදහරණයක් මගින් පැහැදිලි කරන්න.

iv. සීමිත පොදු සමාගමක් සාමාන්‍ය කොටස් නිකුත් කිරිම වෙනුවට ඇතැම් අවස්ථාවල දි ණයකර නිකුත් කරයි. හේතු සඳහන් කරන්න.

v. අ. ව්‍යාපාර ආයතනවල තොග නිකුත් කිරිමේ (මිල කිරිමේ) විවිධ ක්‍රම භාවිතා කරයි. එවැනි තොග නිකුත් කරන ආකාර 05 ක් සඳහන් කරන්න.

ආ. තොග ගනනය කිරීම යනු කවරේද? එමගින් ලබාගත හැකි ප්‍රයෝජන කවරේ ද?

vi. කෙටි සටහන් ලියන්න.

අ. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

ආ. ද්‍රව්‍ය අධියාචනා පත්‍රය

ඇ. පරිවර්ත්‍ය ණයකර

2) i. "සාම්ප්‍රදායික අලෙවිකරණ සංකල්පයෙන් ඔබ්බට යමින් 21 වැනි ශත වර්ෂයේ අලෙවිකරුවන් සාකල්‍යවාදි අලෙවි කරණ සංකල්පය වෙත ප්‍රවේශ වෙමින් පවතී"

අ. මෙම සංකල්පයෙන් අදහස් කරන්නේ කුමක් ද?

ආ. මෙම සංකල්පයෙන් අවධාරණය කෙරෙන ප්‍රධාන සාධක නම් කරන්න.

ii. " සෑම නිෂ්පාදන ආයතනයක්ම තත්‍ව පාලනය අනුගමනය කරයි."

අ. තත්‍වපාලනය යනු කවරේදැයි පැහැදිලි කරන්න.

ආ. තත්ව පාලනය සම්බන්ධයෙන් යොදා ගන්නා ක්‍රම මොනවා ද ?

iii. අ. මුදල් හා මූල්‍ය යනු එකක් නොව දෙකකි. පැහැදිලි කරන්න.

ආ. ව්‍යාපාරයක ප්‍රධාන මූල්‍ය කාර්‍යයන් දෙක කවරේ ද?

iv. " මානව සම්පත් කාර්යයක් ලෙස දුක් ගැනවිලි විසදීම වැදගත් කාර්යයක් වී තිබේ.

අ. සේවක දුක් ගැනවිල්ලක් යන්නෙන් කුමක් අදහස් කරයි ද?

ආ. දුක් ගැනවිල්ලක් ඇති වීමට තුඩු දෙන හේතු මූලික වශයෙන් වර්ග කර ඒ යටතට ඇතුලත් කල හැකි සාධක 2 බැගින් ලියන්න.

v. "ව්‍යාපාර සැලැස්මක් කරුණු ගණනාවකින් අන්තර්ගත වේ." ඒ අනුව ව්‍යාපාර සැලැස්මක ආයතනය පිලිබඳ සාරාංශය අන්තර් ගතය කෙටියෙන් සඳහන් කරන්න.

vi. පහත සඳහන් සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. කළමනාකරන භූමිකා

ආ. ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර

ඇ. බහුකෙඳි ගිවිසුම

3) i. "සෑම කළමනාකරුවකුම සාර්ථක කළමනාකරුවකු නොවේ." කළමනාකරුවකු අසාර්ථක වීමට බලපෑ හැකි දූර්වල හා කිසිවක් තිබේද ? නම් කරන්න.

ii. "සැලසුම්කරණයක් නොමැති තැන පාලනයක් ද නැත" ඉහත ප්‍රකාශය පැහැදිලිකර සැලසුම්කරණය හා පාලනය අතර පවතිවන අන්‍යෝන්‍ය සම්බන්ධතාවය රූප සටහන් මගින් පෙන්වා දෙන්න.

iii. සංනිවේදන මිශ්‍රය /ප්‍රවර්ධන මිශ්‍රය පැහැදිලි කර ප්‍රවර්ධන මිශ්‍රයට ඇතුලත් වන උපාය මාර්ග නම් කරන්න.

iv. " භාණ්ඩයක ඇසුරුමක් මගින් විකුණුම් කරුවන්ට මෙන්ම පාරිභෝගියන්ට ද පහසුවක් ඇති කරයි"

"ඉහත සඳහන් කල ප්‍රකාශය ඔබ සනාථ කරන්නේ කෙසේ ද?

4) i. කෙටි සටහන් ලියන්න.

අ. අපත්‍යාග ලිපිය.

ආ. ඌන වෙළඳම.

ඇ. ආර්ථික ඇනවුම් ප්‍රමානය.

ii. මිනිස් බල සැලැස්මක් සැලසුම්කරණයේදී සේවකයන් අතිරික්තයක් පවතින විට හා සේවකයන්ගේ ඌනතාවයන් පවතින විට දි ගත හැකි ක්‍රියා මාර්ග වෙන වෙනම සඳහන් කරන්න.

iii. අ. නිෂ්පාදිත මිශ්‍රය හඳුන්වන්න.

ආ. ව්‍යාපාරිකයන් එකම නිෂ්පාදිත මිශ්‍රයක් අඛන්ඩව පවත්වා නොගනි. ඒ සඳහා බලපාන හේතු කවරේ ද?

iv. අ. අලෙවි මිශ්‍රය යටතේ ගැනෙන "ප්‍රසිද්ධිය" උදහරන සහිතව පැහැදිලි කරන්න.

ආ. ප්‍රසිද්ධියේ විශේෂ ලක්‍ෂණ නම් කරන්න.

5) i. කළමනාකරණ මුලිකාංගයට අයත් මෙහෙයවිම කාර්‍යයට අයත් අංග සඳහන් කර එය ව්‍යාපාරයක සාර්ථකත්වයට බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

ii. අභ්‍යන්තර විදේශිය විනිමය වෙළඳපොළ යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? එහි කාර්‍යයන් සඳහන් කරන්න.

iii. පුද්ගලයකු සතුව රුපියල් මිලියනයක අතිරික්ත මුදලක් ඇතැයි සිතන්න. ඒ සඳහා පහත සඳහන් ආයෝජන මාර්ග ගැන සලකා බලමින් සිටි.

අ. ඒකකභාරයක ඒකක මිලදි ගැනිම.

ආ. මුල්‍ය සමාගමක ස්ථාවර තැන්පතුවක ආයෝජනය.

ඇ. භාණ්ඩාගාර බිල්පත්වල අයෝජනය කිරීම.

මෙම එක් එක් ආයෝජන මාර්ගවලින් අත්කර ගත හැකි ප්‍රතිලාභ හා අවධානම් පැහැදිලි කරන්න.

iv. අ. කල්බදු ණයක් හා බැංකු ණයක් අතර ඇති වෙනස්කම් කවරේ ද?

ආ. කාරක ප්‍රාග්ධනයට සපයා ගත හැකි මාර්ග සඳහන් කරන්න.

6) i. ස්වයං රැකියාවක් යනු කවරේදැයි පැහැදිලි කර ස්වයංරැකියාවක් කුඩා ව්‍යාපාරයකින් වෙනස් වන ආකාරය දක්වන්න.

ii. කෙටි සටහන් ලියන්න.

අ. සේවාදායක චලන

ආ. මධ්‍යම තැන්පතු ක්‍රමය

ඇ. ඍජු අලෙවිකරණය

iii. රැකියා ගිවිසුමක් යනු කුමක් ද ? එවැනි ගිවිසුමක අඩංගු විය යුතු මූලික තොරතුරු කවරේ ද ?

iv. පරිඝනක මේස නිෂ්පාදකයකුගේ මුළු ස්ථාවර පිරිවැය මිලියන 01 කි. මේසයක විචල්‍යය පිරිවැය රු. 2000/= පරිඝනක මේසයක් විකුණුම් මිල රු. 3000/= කි.

අ. ලාභ සම්ච්ඡේදනය වීම සඳහා නිපදවිය යුතු පරිඝනක මේස සංඛ්‍යාව කොපමණ ද?

ආ. නිෂ්පාදකයකුට ලාභ සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහයේ වැදගත්කම පැහැදිලි කරන්න.